# සුළු ගොවි සංවිධාන ක්‍රමය

# (ගල්ගමුවේ අත්හද බැලීම)

**ගල්ගමුව ගොවි ජන සේවා බල ප්‍රදේශය තුළ දැන් අත්හද බලනු ලබන සුළු ගොවි සංවිධාන ක්‍රමය සම්බන්ධයෙන් එම වැඩ පිළිවෙල මෙහෙයවන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙහි එස්. බී. ආර්. නිකහැටිය හා එස්. එම්. පී. සේනානායක යන පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරීන් සමග කළ සාකච්ඡාවකි.**

ගොවිතැන් බත් කර ගැනිමයි එදත් අදත් අපේ දිවි පෙවෙත රැක දුන්නෙ. අපේ රටේ වැඩි දෙනෙක් සුළු ගොවීයො. මොවුන් එක් අයෙකු සතුව අක්කර 2–3 කට වඩා නැහැ. මෙබඳු සුළු ගොවි පවුල් දශ ලක්ෂ දෙකක් පමණ ග්‍රාමීය කෘෂි කර්මයෙන් ජීවිතය ගෙන යනවා. ඒ වුනත් රටේ ජනගහණයේ වැඩි කොටස සමන්විත වන්නෙ මේ පිරිසගෙනුයි. ඒ සුළු බිම් කට්ටියෙන් පවුලක් රැක ගෙන රටටත් බෙද දෙන ආහාර අතිරික්තයක් නිපද වන්නෙ කොහොම ද? මෙය අප රට සංවර්ධනයේ දි මුහුණ පාන මූලික ප්‍රශ්නය යි.

රට නිදහස ලැබුවායින් පසුව සුළු ගොවි පවුල් වල තත්ත්වය නංවාලීමට ඒ ඒ රජයන් නොයෙකුත් අන්දමේ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කළා. 1979 ගොවිජන සේවා පණත මෙහිදී විශේෂයෙන් සඳහන් කළයුතුයි. විශේෂයෙන් ප්‍රජාතන්ත්‍ර වාදී ක්‍රමය ග්‍රාමීය ආයතන නැවත හැඩ ගැස්වීමට මෙම ගින් ඉඩකඩ සැලසුනා. ගොවි ජන සේවා කමිටු ප්‍රාදේශීය මට්ටමිනුත්, වගා නිලධාරි මට්ටමිනුත් පත් කෙරුණ අතර, යාය මට්ටමින් විදානේවරුන් ගොවීන්ගේම ඡන්දයෙන් තෝරා පත් කෙරුණා.

මේ අනුව, ගොවි නියෝජිතයන් 63,000 ක් යාය මට්ටමින් දැන් තෝරා ගෙන තිබෙනවා. ඔබ දන්නා පරිදි මේ 'විදානේ' වරුන් පත් කිරීම අතිතයේ සිට 1950 ගණන් දක්වා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වන 'වෙල් විදානේ' ක්‍රමය නැවත ප්‍රයෝජනයට ගැනීමට සකස් කෙරුණ වැඩ පිළිවෙළකි.

රට සහලින් ස්වයං පෝෂිත කිරීමේ කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන මේ කාලයේ විදානේ වරුනට භාර දූර කාර්යයන් රැසක් පැවරි තිබෙනවා. මේ විදානේ වරුනට භාර දූර කාර්යයන් රැසක් පැවරී තිබෙනවා.

යායේ ගොවීන් හා ගොවි ජන සේවා කමිටුව අතර සම්බන්ධතා පුරුකක් ලෙස කටයුතු කිරීම.

බොහෝවිට යායේ 'සම්බන්ධිත' ගොවියා වීම.

නැතිනම් ආදර්ශ ගොවියා වීම.

යායේ නිෂ්පාදන සැලසුම් සකස් කිරීමට මූලිකත්වය දීම.

යායේ දිය බෙදීමේ කටයුතු.

ණය යෙදවුම් ලබා ගැනීමට මූලික වීය.

ප්‍රශ්නය- 'සුළු ගොවි සංවිධානවල නායකයින් උදෙසා නැතිනම් විදනේ වරුන් උදෙසා දැනට සාර්ථක අන්දමින් ඉටු කර තිබෙන නියාමක වැඩ පිළිවෙළ ගැන විස්තරයක් අප පාඨකයන් හමුවේ තබන්න පුළුවන් ද?

පිළිතුර- මේ වැඩ පිළිවෙළ ගැන ආහාර හා කෘෂි කර්ම සංවිධානය දීර්ඝ කාලයක සිට සැහෙන උනන්දුවක් දැක්වූවා. අප මුලින් ම නියාමක වැඩ පිළිවෙළක් නැති නම් අත්හද බැලීම් වැඩ පිළිවෙළක් උදෙසා එක කෘෂි සේවා මධ්‍යසථාන ප්‍රදේශයක් නැත්නම් ගොවිජන සේවා ප්‍රදේශයක් තෝරා ගත්තා. මෙසේ තෝරා ගත්තේ, කුරුණෑගල දිස්ත්‍රික් කයේ, ගල්ගමුව ප්‍රදේශීය නිලධාරි කොට්ඨාශය යි. මෙම මධ්‍යසථානයේ බල ප්‍රදේශයේ කුඹුරු අක්කර 3,000 කුත්, ගොවිපවුල් 1,200 කුත් අයත් වෙන වා. දැනට යායවල් 61 කට විදනේවරු 61 දෙනෙකු පත් කර තිබෙනවා. ඔවුන් 41 දෙනෙක් ගොවි සමූහ පිහිටුවා ගත්තා.

ප්‍රශ්නය- හොඳයි, ව්‍යාපාරයේ කටයුතු කොයි විදිහට ද පටන් ගත්තේ?

පිළිතුර- මුලින්ම විදනේවරුන්ගේ නායකත්වය යටතේ සුළු ගොවින් සමූහ වශයෙන් සංවිධානය කළා. මේ විදනේවරුන්ගේ රාජකාරී අවශ්‍යතා සොයා බැලුවා. ඊට නිෂ්පාදන වැඩ සැලසුම් කිරීම, වාරි මාර්ග කළමණාකරණය, අලෙවි වැඩි දියුණු ක්‍රම භාවිතය, යන්ත්‍ර උපකරණ භාවිතය, වගා ණය, වැඩි දියුණු බීජ, කෘමි නාශක යනාදී කරුණු අඩංගු වූහ. මේවා පන්ති වලට වඩා සාකච්ඡා වශ යෙනුයි පැවැත් වුනේ. මේ වාට ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂි කර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ලංකා බැංකුව හා ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය යන සංවිධාන වල නිලධාරීන් සහභාගි වූනා.

දැන් මෙතනින් තවත් වැදගත් කරුණක් අත් හද බලනවා. මේ විදනේ වරුන් මධ්‍යස්ථානයේදී ලබා ගන්නා දැනුම



සාකච්ඡාවකට පැමිණි විදනේවරුන් පිරිසක්



ගොවි ජන සාකච්ඡාවක්

ඔවුන් ආපසු ගම්වලට ගියහම ඒ ඒ යායේ ගොවීනට නැත්නම් ගොවිසමූහ වලට බෙද දීම අපේක්ෂා කරනවා. මෙතන දී ඔබට පෙනී ගියා 'සමූහ' ක්‍රමය මේ හැම කටයුත්තකම මැදින් දිවෙන බලවේගයක් බව.

ප්‍රශ්නය- ඔය සමූහ ගොවිතැන් ක්‍රමයේ වැදගත් ලක්ෂණ මොනවා ද?

පිළිතුර- සමූහ වශයෙන් ගොවිතැන් කරනවා කියන්නේ සමූපකාර ක්‍රමයට සමූහයක් එක් වෙලා එකම ඉඩම වගා කරලා නිෂ්පාදනය නැතිනම්, ආදායම බෙදා ගැනීම නොවේ. තම තමන්ගේ ඉඩම් වගා කරන නමුත් හිතු මනාපේ වගා නොකර සායන ගොවීන් සමූහයක් වශයෙන්, එක් රැස් වෙලා කන්නය මුලදී සැලැස්මක් පිළියෙල කරගෙන ඒ අනුව වගා කරනවාටයි සමූහ වශයෙන් ගොවීතැන් කරනවායයි කියන්නේ. මේකෙ වාසි කිහිපයක්ම තියෙනවා.

ගොවි කණ්ඩායම් අතර තාක්ෂණික දැනුම ආර්ථික තත්ත්වය ආදිය හේතු කොට ගෙන ඇතිවන වෙනස්කම් නිසා පැන නගින නිෂ්පාදන විෂමතාවය අඩු කර ගන්න පුළුවන්.

ගොවිපල උපකරණ, යෙදවුම්, වගා ණය, සමූහයක් වශයෙන් මිල දී ගැනීමට හෝ ලබා ගැනීමටත් ප්‍රවාහනය කිරීමටත් හැකි වීමෙන් වියදම් අඩු වන අතර, පෞද්ගලික ගොවීන්ගේ කාලය සෑහෙන ලෙස ඉතිරි කර ගන්න පිළිවන.

ජල පාලනය කාර්යක්ෂම ලෙස ඉටු කර ගැනීමට පිළිවන.

කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු, සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වීම.

අලෙවි පහසුකම්.

පොදු සේවා සලසා ගත හැකි වීම- ට්‍රැක්ටර්.

සියළුම ගොවීන්ට සාමාන්‍ය ඵලදායීතාවය පමණක් වැඩි වීම,

සමස්ථයක් වශයෙන් ගත් කල පොඳු ගලික කුඩා බිම් කට්ටි තනි තනියෙන් වගා කරන අතර සමූහයක් ලෙස කට යුතු කරන මහා පරිමාණ ගොවිතැන් කටයුතුවල ලද හැකි වාසි මේ ක්‍රමයෙනුත් ලබා ගත හැකි යි.

ප්‍රශ්නය- මුලින්ම මේ වැඩ පිළිවෙල ගල්ගමුව ප්‍රාදේශීය නිලධාරි ප්‍රදේශය තුළ ලබා ඇති සාර්ථකත්වය කොහොම ද?

පිළිතුර- මුලින්ම වැඩ සටහන මගින් අප දැන් විද්‍යාතේ වරුනට අවශ්‍ය වන්නාවූ කවර අන්දමේ පුහුණුවක් ද, එය ලබා දිය යුත්තේ කෙසේද යන්න සොයා බලා තිබෙනවා. එපමණක් නොවෙයි, සුළු ගොවි සමූහ සංවිධානය ගැනත් සෑහෙන අත්දැකීමක් ලබා ගත්තා. ජාතික වැඩ සටහනක් සකස් කිරීමේදී එය වැදගත් වෙනවා.

ඊළඟට ගොවි සමූහ ගත්තාම ඒවා මුලින්ම ඉටු කළ කාර්ය 1980/81 මහ කන්නයට නිෂ්පාදනය සැලසුම් වල සකස් කිරීම යි. ඔවුන් සමූහයේ අවශ්‍ය බිත්තර වී, පෝර, වශයෙන්, බල ශක්ති, ට්‍රැක්ටර්, තාක්ෂණ, යනාදිය කොපමණද යන්න තිරණය කලා.

ඒවා ගල්ගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේදී නිෂ්පාදන සැලසුම් වලට ඇතුළත් කළා. මේ නිසා අවශ්‍ය දේ පහසුවටත්, ලබා ගැනීමට කටයුතු කළ හැකි වුනා.

වාරිමාර්ග ජලය පාලනය ඊළඟ වැදගත් කටයුත්තයි. සැලැස්මකට අනුව කට යුතු කිරීම සහ කලට වේලාවට වගා කිරීම නිසා වැව් වල ජලය යල බෝග වගාවකටත් මේ බල ප්‍රදේශයේ ඉතුරු කර ගත හැකි වුනා.

මේ ප්‍රදේශයේ ගත් ණය ආපසු නොගෙවීමේ හේතුවෙන් බැංකු වල වගා ණය වලට නුසුදුසුවූත්, ගොවීන් 231 සිටියා. කෙසේ වුවත් සමූහය වගකීම භාර ගැනීම නිසා සමූහයේ නිර්දේශ මත ගොවින් බොහොමයකට වගා ණය ලබා දුන්නා. මේ වැඩ පිළිවෙළ සියයට සියයක්ම වාගේ සාර්ථක වුනා. ගොවින් හැම දෙනෙකුම වාගේ ගත් වගා ණය ආපසු ගෙව්වා.

මහ කන්නයේ අස්වනුත් සරු වුනා. මේ නිසා වී සාධාරණ මිලකට විකුණා ගැනීම ගොවීනට සෑහෙන ප්‍රශ්නයක් වුනා. මෙහි දී වී අලෙවි මණ්ඩලය වී විකුණා ගැනීමට වැඩ පිළිවෙළක් සංවිධානය කෙරුණා. මෙහි කටයුතු සංවිධාන යෙහි මූලිකත්වය ගත්තේ විද්‍යානේවරුන්.

ඒ විතරක් නොවෙයි ගොවීන් අතරේ ඉතිරි කිරීමේ වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක වෙනවා. සමූහ රැස්වීම්වලදී ශත 25 තරම් මුදලක් ඉතිරි කිරීමෙන් මෙය ආරම්භ කළා. දැන් සමහර ගොවීන් රු 100–400 දක්වා මුදල් ඉතිරි කරනවා.

ප්‍රශ්නය- දැන් මේ වැඩ පිළිවෙළවල් වල ඊළඟ පියවර මොකක් ද?

පිළිතුර- කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ගත්ත තීරණයක් අනුව ගල්ගමුව අත්දැකීම් රටේ අනෙකුත් ප්‍රදේශවලටත් ලබා දීමට වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. මේ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ හැම ප්‍රාදේශීය නිලධාරි කොට්ඨාශයකමත් අනෙකුත් දිස්ත්‍රික්ක 23 හි එක් එක ප්‍රදේශයේ නිලධාරි කොට්ඨාශයක් තුලත් මෙබඳු වැඩ පිළිවෙළක් දැන් ආරම්භ කර ගෙන යනවා.